“අල්ලාහ්ගේ මාර්ගයේ සිටින ගැත්තකුගේ දෙපා මත තැවරෙන දූවිලි, (ඒ හේතුවෙන්) නිරා ගින්න ඔහුව ස්පර්ශ නොකරනු ඇත.“

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලය්හි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ අබ්ස් අබ්දුර් රහ්මාන් ඉබ්නු ජබ්ර් (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “අල්ලාහ්ගේ මාර්ගයේ සිටින ගැත්තකුගේ දෙපා මත තැවරෙන දූවිලි, (ඒ හේතුවෙන්) නිරා ගින්න ඔහුව ස්පර්ශ නොකරනු ඇත.“ [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් බුහාරි එය වාර්තා කර ඇත]

අල්ලාහ්ගේ මාර්ගයේ වෙහෙසෙමින් සිටිය දී තම දෙපා දූවිලිවලින් තැවරුනු තැනැත්තකු වී නම් අපා ගින්න ඔහුව ස්පර්ෂ නො කරන බව පවසා නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ඔහුට ශුභාරංචි දන්වා ඇත.

https://sunnah.global/hadeeth/si/show/3868